# ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාල

## පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් ගෙන් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය විසින් **04.12.2018** දක්වා අයදුම්පත් භාරගනු ලැබේ.

### 01.උපාධිධාරී පරිවර්තක තනතුර (II ශ්‍රේණිය) සිංහල - ඉංග්‍රීසි

**<u>සුදුසුකම්:</u>**

**(i)** සිංහල භාෂාව සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

**<u>සහ</u>**

**(ii)** අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි භාහිත්‍යය සඳහා C සාමාර්ථයක් හෝ අ:පො:ස උසස් පෙළ විභාගය හෝ උසස් විභාගයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා සමත් වී තිබිය යුතුය.

**(iii) සටහන:** උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස හදාරා ඇති සහ/හෝ භාෂා තුන පිළිබඳ නිපුණත්වය ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛස්ථානය හිමිවනු ඇත.

### 02. උපාධිධාරී පරිවර්තක තනතුර (II ශ්‍රේණිය)දෙමළ - ඉංග්‍රීසි

**<u>සුදුසුකම්:</u>**

**(i)** දෙමළ භාෂාව සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

**<u>සහ</u>**

**(ii)** අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි භාහිත්‍යය සඳහා C සාමාර්ථයක් හෝ අ:පො:ස උසස් පෙළ විභාගය හෝ උසස් විභාගයක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා සමත් වී තිබිය යුතුය.

**(iii) සටහන:** උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස හදාරා ඇති සහ/හෝ භාෂා තුන පිළිබඳ නිපුණත්වය ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛස්ථානය හිමිවනු ඇත.

***වැටුප් පරිමාණ:*** U-MN 3(II) 01.01.2020 දිනට - රු 42,885 – 18 x 660 – 54,765මාසයකට

(මෙම වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ)

**වයස :** අවුරුදු 45 ට නොවැඩි.

(ඉහත වයස් සීමාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා, උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරන අයදුම් කරුවන් සඳහා අදාල නොවේ.

**තෝරා ගැනීමේ පරිපාටිය :** විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරා ගැනීම සිදුකරනු ලැබේ.

## <u>තනතුරු සඳහා අදාල අනෙකුත් වරප්‍රසාද</u>

තෝරාගත් අපේක්ෂකයින් ඔවුන්ගේ මාසික වැටුපෙන් 10%ක මුදලක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායකකත්වයක් සපයන අතර, සේවා යෝජකයා විසින් වැටුපෙන් 15% ක ප්‍රමාණයක් එනම් 8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම අරමුදලට ද, 7% ක කොටසක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ද ලෙස දායක කරනු ඇත. මෙයට අමතරව ඔවුන්ට සේවක භාරකාර අරමුදලේ දායකත්වය හිමි වන අතර, ඒ සඳහා විශ්වවිද්‍යාලය විසින් වැටුපෙන් 3% ක කොටසක් දායක කරගනු ලැබේ.

## <u>අයදුම්පත් සහ විස්තර</u>

අයදුම්පත්, අවශ්‍ය සුදුසුකම් සහ අනෙකුත් විස්තර විශ්වවිද්‍යාලයේ www.seu.ac.lk දරන වෙබ් ලිපිනයෙන් ලබාගත හැක. උනන්දුවක් දක්වන අයදුම්කරුවන් හට වෙබ් අඩවියෙන් බාගත කරගත් අයදුම් පතක් සමඟ රු 200/= ක ගාස්තුවක් මහජන බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙත **ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ මහජන බැංකුවේ අඩ්ඩාලච්චේන ශාඛා ගිණුම් අංක 228-1001-9000-1704** ට ගෙවා අදාළ ගෙවීමේ වවුචරය ද අමුණා එවිය යුතුය.එක තනතුරකට වඩා වැඩියෙන් අයදුම් කරන අයදුම් කරුවන් අදාළ එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත අදාල සහතික වල පිටපත් සමඟ ලියාපදිංචි තැපෑලෙන් **ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය, ඔලුවිල් # 32360** යන ලිපිනයට **04.12.2018 දිනට හෝ ඊට පෙර** ලැබෙන සේ එවිය යුතුය.ඉල්ලුම් කරන තනතුරේ නම ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කළ යුතුය.

රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත අදාල ආයතන ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතුය. නමුත්, මූලිකව අතිරේක පිටපතක් එවීමේ හැකියාව ඇත. කෙසේ වෙතත් අදාල අයදුම්පත් නියමිත මාර්ගයෙන් ආයතන ප්‍රධානියා හරහා නොවන අයදුම්කරුවන් අදාළ තනතුර සඳහා සලකා බලනු නොලැබේ.

අසම්පූර්ණ සහ නීත්‍යානුකූල නොවන හෝ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හෝ ඉහත සඳහන් කොන්දේසි සපුරා නොමැති අයදුම්පත් පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරුවන් තෝරාගැනීමේ අයිතිය ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සතු වේ. එසේ තෝරාගන්නා අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**ලේඛකාධිකාරී**
**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය,**
**ඔලුවිල් # 32360**
**30.10.2018**